- එමෙන්ම ආයෝජකයින් තම ව්‍යාපාරයේ නවදූරටත් රැඳී සිටීමට යොමුවන අතර, නව ආයෝජනවලට රුකුල් දීමටත් ව්‍යවසායකයින්ව දිරිමත් කරනු ඇත.
- ව්‍යාපාර ආයතනයට සිදුවිය හැකි අර්බුද හා අවදානම් තත්ත්ව අවම කරගැනීමටත් හැකි වන අතර, එයට විශේෂ හේතුව වන්නේ, තමා වටා සිටින පාරිභෝගිකයින්, ආයෝජකයින්,සැපයුම්කරුවන් ඇතුළු සියළුදෙනා මෙම ව්‍යාපාරය කෙරෙහි සුභවාදිව බැලීමයි.
- එමෙන්ම දේශපාලනමය ප්‍රවලිතතාවන් මෙවන් ව්‍යාපාරවලට ලැබෙන අතර, විශේෂයෙන් දේශපාලකයින් ගේ උදව් මෙන්ම ඔවුන් ගේ මැදිහත්වීමෙන් සමාජයට සුභ සිද්ධියක් වන අයුරින් දැනට පනවා ඇති නීතිමය තත්ත්වයක් වෙනස්කර ගැනීමට ද හැකිවනු ඇත.

## සමාජයීය වගකීම් නොදරණ , මෙන්ම ඒගැන තැකීමක් නොකරන ව්‍යවසායකයින් හට මුහුණපෑමට සිදුවන ප්‍රශ්න

මෙවැනි ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර ගැන නිරන්තර සෝදිසියකින් මහජනතාව මෙන්ම නොයෙකුත් සංවිධාන ද සිටින අතර, ව්‍යාපාරවල දිගු පැවැත්ම ගැන සුරක්ෂිත භාවයක් ද නැත. එනිසා මෙම ව්‍යවසායකයින් හට කැපවීමෙන් යුතු සේවකයන් ලබාගැනීම අපහසු වනු ඇත. සේවක අර්බුද, ආයෝජකයන්ගේ අර්බුද වලට ද මුහුණු පෑමට සිදුවේ. තම වෙළඳ නාමය මෙන්ම කීර්තිය ද කැපී නොපෙනෙනු ඇත. කෙටි කාලීන ලාභ ඉපයීමක් කළ හැකි වුවද දීර්ඝ කාලීන පැවැත්ම ගැන විශ්වාසයක් තැබිය නොහැකිය.

ශ්‍රී ලංකාවේ වැදගත් යැයි සැලකෙන ව්‍යාපාරිකයන් (සමාජයීය යුතුකම් නොපිරිහෙලා ඉටු කරන ) නිරතුරුවම තම සමාජයීය යුතුකම් හා වගකීම් මනා අයුරින් දැන සිටින අතර, ඒවාට දායකත්වයක් දී හැකි පමණින් ඒවා ඉටු කිරීමට යම්කිසි දිරියක් ගනු ලබයි. කෙසේ වෙතත්, ප්‍රායෝගිකව බලන කල මෙකී සමාජයීය වගකීම් සියල්ල ඉටු කිරීමට මොනම හෝ ව්‍යවසායකයකුට හෝ නොහැකි බව දන්නා කරුණක් වුවත් තම උපරිමයෙන් මෙම කර්තව්‍යය ඉටුකිරීමට දායකවීම සෑම ව්‍යවසායෙකුගේම වගකීමයි.




වගකීම් උසුලන ව්‍යවසායකුගේ හැඟීම

## කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට විශේෂිත වූ කාර්මික සංවර්ධන මණ්ඩලීය පුස්තකාලය

ශ්‍රී ලංකාවේ පුස්තකාල අතර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල පුස්තකාලය කුඩා හා මධ්‍යම පරිමාණ ක්ෂේත්‍රයට සුවිශේෂී මෙහෙවරක් ඉටුකරයි. තිස්නව වසරක (අවුරුදු 39) ක ඉතිහාසයක් තුළ නොයෙකුත් වෙනස්වීම්වලට ලක්වෙමින් අද ප්‍රධාන පෙළේ පුස්තකාලයක් පමණක් නොව තොරතුරු මධ්‍යස්ථානයක් වී ඇත. අප පුස්තකාලය මණ්ඩලයේ අනෙකුත් විස්තාරණීය සේවා අංශවලට නිරතුරු සහාය වෙමින් මණ්ඩලයේ පිටකොන්ද සේ නොසැලී සිටී. වෙනත් විශේෂ පුස්තකාලවලට සමගාමීව දේශීය හා විදේශීය ආයතන හරහා මුද්‍රිත හා මුද්‍රිත නොවන මාධ්‍ය ඔස්සේ තොරතුරු ලබාගෙන, එම තොරතුරු උසස් විඥාපණ රීතීන් අනුව මනාව සංවිධානයකර පරිශීලනයට අවස්ථාව සලසා ඇත.

මෙම කාර්ය සඳහා පළපුරුදු වෘත්තීය නිලධාරීන්ගේ සේවය නොමසුරුව ලැබෙන අතර, කාලීන අවශ්‍යතාවයක් ලෙස සලසා විෂය සංවිධානය පරිගණක ආශ්‍රිතව සිදුකරනු ලබයි.

ගතවූ තිස්නව වසරක් තුළ අප පුස්තකාලයෙන් ප්‍රයෝජනය ලබාගත් පිරිස අතර කර්මාන්තකරුවන්, ව්‍යවසායකයින්, කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුව දක්වන පුද්ගලයන්, විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන්, පර්යේෂකයින්, ආචාර්ය, මහාචාර්යවරුන් හා විදේශීය ආයෝජකයින් කැපී පෙනේ.

කාර්මික තොරතුරු, ග්‍රාමීය කර්මාන්තකරුවන් සහ ව්‍යවසායකයන් වෙත ගෙනයාමේ අරමුණින් ආරම්භකර ඇති ගම්පහ සහ මාතලේ තොරතුරු මධ්‍යස්ථාන මෑතකාලීනව ආරම්භකර ඇත.

**සතී මංජුලා**
පුස්තකාල සහකාර